# සුළි කුනාටු සහ සුනාමි අනතුරු ඇඟවීම් සඳහා වර්ණ සංඥා ක්‍රමයක්





**සුනාමි** **සුළි කුනාටුව**

සුළි කුනාටු සහ සුනාමි පිළිබඳව අනතුරු ඇඟවීම් සඳහා ජාතික වගකීම ඇත්තේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවටය. සුළි කුනාටු පිළිබඳව අනතුරු ඇඟවීම තනිවම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ රෙගුලාසි වලට අනුකූලව ඉටුකරනු ලබන අතර සුනාමි සම්බන්ධව 2004 සුනාමි තත්ත්වයෙන් පසුව තාක්ෂණ කමිටුවක උපදෙස් අනුව අනතුරු ඇඟවීම් කරනු ලැබේ.

මෙම අනතුරු ඇඟවීම් සාමාන්‍ය ජනතාව වෙතට සන්නිවේදනය කිරීම සඳහා ආයතන බොහොමයක් උදව් කරනු ලැබේ. ජනමාධ්‍ය, පොලිසිය, රාජ්‍ය නොවන සංවිධාන දීර්ඝ කාලයක් තිස්සේ සුළි කුනාටු ඇතුළු කාලගුණය සම්බන්ධ අනාවැකි සහ අනතුරු ඇඟවීම් ජනතාව අතරට ගෙනයාමට උදව් වූ අතර, වර්තමානයේ සුනාමි අනතුරු ඇඟවීම් ද සමගින් මෙම අනතුරු ඇඟවීම් ජනතාව අතරට ගෙනයාම සඳහා ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය ද උදව් කරනු ලැබේ. දහවල් කාලයේදී මෙම කරුණ පහසු වුවත් රාත්‍රී කාලයේදී විශේෂයෙන් සුනාමි වැනි අනතුරු ඇඟවීම් සියළුම අදාල ජනතාව වෙත දැනුම් දීම ඉතා අපහසුය.

මෙම කටයුත්ත යම් තරමකට පහසු කිරීම සඳහා, වර්ණ සංඥා ක්‍රමයක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑතකදී හඳුන්වා දී ඇත. එමගින් බලාපොරොත්තු වන්නේ සවන්දීමට වඩා ඉක්මනින් හා සරල ලෙස අනතුරේ ප්‍රමණය ජනතාවට දැනුම් දීමට කටයුතු කිරීමයි. එහිදී හුදෙක් දැනගැනීම සඳහා පමණක් නම් සුදු වර්ණය භාවිතා කරනු ලැබේ. අවදානම් ප්‍රදේශය හැරයාමට සූදානම් විය යුතු තත්ත්වයක් නම් තැඹිලි පැහැයද, ප්‍රදේශය හැර යා යුතු නම් රතු වර්ණයද භාවිතා කරනු ලබන අතර, අනතුර හමාර වී ඇත්නම් කොළ පැහැති වර්ණයද භාවිතා කෙරේ.

පසුගිය කාලයේ යම් අවස්ථාවලදී මහජනතාව අනියත ලෙස සුනාමි තත්ත්වයක් ඇතැයි බිය විය. එවැනි අවස්ථාවලදී සුනාමි තත්ත්වයක් නැතැයි කීමට නිල ඇඳුම් සහිතව යම් නිලධාරියකු පැමිණිය හොත්, ජනතාව සිතනුයේ සුනාමි තත්ත්වයක් සැබෑවටම ඇති බවය. එවැනි අවස්ථාවක නිලධාරීන් අත කොළ පැහැති කොඩියක් තිබුනහොත් සැබෑ තත්ත්වය ඉතා ඉක්මනින්ම තෙරුම් ගත හැකිවනු ඇත. පසුගිය කාලයේදී අනියත බියක් ඇතිවූ අවස්ථාවල සුනාමි තත්ත්වයක් නැතැයි යන්න සංඥා නිකුත් කිරීමේ කුළුනු මගින් විකාශය කරන ලදී. කුළුනු වලට තරමක් දුරින් සිටින ජනතාවට යාන්තමින් ඇසෙන සුනාමි යන වචනය හේතුවෙන් අනතුරු ඇඟවීමේ කුළුනෙනුත් සුනාමිය ගැන කියනවා යයි සිතමින් කලබලයට පත්වේ. ශබ්දය සමග කුළුනු වල වර්ණවත් විදුලි පහන් දැල්වීම මගින් මෙම තත්ත්වය මඟහරවා ගත හැක. කුළුනේ රතු විදුලි පහන් දැල්වේ නම් සැබෑවටම සුනාමි තත්ත්වයක් ඇතැයි දැනගෙන ඉවත්විය හැකි අතර කොළ පැහැති විදුලි පහන් දැල්වේ නම් අනතුරක් නැති බව දැන ගත හැක. තවදුරටත් අනතුරේ ස්වභාවය දැනුම් දීම සඳහා අංක ක්‍රමයක්ද හදුන්වා දී ඇත. වචනයෙන් බොහෝදේ කියනවාට වඩා මෙම අංකය දැන ගැනීමෙන් අංකයට අඳාල අනතුරේ ස්වභාවය ඉක්මනට අවබෝධ කරගත හැක.

ස්වාභාවික ආපදා බහුල බොහෝ රටවල ක්‍රියාත්මක වන මෙම සරල ක්‍රමයට මහජනතාව හුරුවීමට කාලයක් ඒ රටවල ගතවී ඇත්තා සේ මේ සඳහා ලාංකික ජනතාව කඩිනමින් හුරුවී ආපදා අනතුර සන්නිවේදනය වඩා ඵලදායී හා කාර්යක්ෂම වේ යයි අපේක්ෂා කරමු.

## 6 සුළි කුණාටු සම්බන්ධව අංක සහ වර්ණ සංඥා ක්‍රම මෙසේය.

| | | සුළි කුණාටු (සුළි සුළං) | |
|---|---|---|---|
| සංඥා අංකය | වර්ණය | විස්තරය | අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය |
| 1 | සුදු | සුළි කුණාටුවක් වර්ධනය වීමේ හැකියාවක් ඇත. | දැනුම්වත් කිරීම පමණි. මුහුදේ ඇති යාත්‍රා විමසිලිමත් විය යුතුය. |
| 2 | සුදු | සුළි කුණාටු තත්ත්වයක් ඇත. | දැනුම්වත් කිරීම පමණි. මුහුදු යාත්‍රා අදාල මුහුදු ප්‍රදේශ මඟහැර සිටිය යුතුය. මාධ්‍යවලට සවන් දෙන්න. |
| 3 | තැඹිලි | සුළි කුණාටු තත්ත්වයක් ඇත. වෙරළබඩ ප්‍රදේශවල වැසි සහ තද සුළං සහ රළු මුහුදු තත්ත්වයක් පැවතිය හැක. | මුහුදු යාත්‍රා අදාල මුහුදු ප්‍රදේශ මඟහැර සිටිය යුතුය. මහජනතාව මුහුදෙන් සහ වෙරළෙන් ඈත් වන්න. |
| 4 | තැඹිලි | සුළි කුණාටු තත්ත්වයක් ඇත. වැසි සහ තද සුළං (නොට්ස් 40/ පැයට කි.මි. 80 පමණ) සහ රළු මුහුදු ඇතිවිය හැක. | වෙරළෙන් ඈත් වන්න. නිවෙස් තුළම සිටින්න. මුහුදු යාත්‍රා වලට අවදානම්ය. |
| 5 | තැඹිලි | තද වැසි සහ ඉතා තද සුළං ඇති විය හැක. (නොට්ස් 40/ පැයට කි.මි. 80 ට වැඩි) | මහජනතාව ශක්තිමත් නොවූ ගොඩනැගිලි සහ ගංවතුර අවදානමක් ඇති පහත් බිම් ප්‍රදේශවලින් ඉවත් වීමට සූදානම් වන්න. ඔබගේ ගේ දොර හා වටිනා ලියකියවිලි ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ගන්න. |
| 6 | රතු | තද වැසි සහ ඉතා තද සුළං (නොට්ස් 40/ පැයට කි.මි. 80 ට වැඩි ) ද සමග, සුළි කුණාටුව ගොඩබිමට ඇතුල්වීමේ හැකියාවක් ඇත. | පෙර සූදානම් කර, නම් කර ඇති ආරක්ෂිත ප්‍රදේශවලට ඉවත් වන්න. |
| 7 | රතු | තද වැසි සහ ඉතා තද සුළං (නොට්ස් 50/ පැයට කි.මි. 100ට වැඩි )සහිත කාලගුණ තත්ත්ව සමග දරුණු කුණාටුව ..................... ගොඩබිම හරහා යනු ඇත. | පෙර සූදානම් කර, නම් කර ඇති ආරක්ෂිත ප්‍රදේශවලට ඉවත් වන්න. |
| 0 | කොළ | සුළි කුණාටු අනතුරු ඇඟවීමේ නිවේදනය ඉවත් කර ඇත. / අවලංගු කිරීමේ නිවේදනය. අනතුරක් නැත. | |

සුනාමි සම්බන්ධ අංක සහ වර්ණ සංඥා ක්‍රම මෙසේය.

| | | සුනාමි | |
|---|---|---|---|
| සංඥා අංකය | වර්ණය | විස්තරය | අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය |
| 1 | සුදු | භූමි කම්පාවක් සිදුවී ඇත. තර්ජනයක් නොමැත. | දැනුම්වත් කිරීම පමණි. |
| 2 | සුදු | විශාල භූමි කම්පාවක් සිදුවිය. | දැනුම්වත් කිරීම පමණි. විමසිලිමත් වන්න. මාධ්‍යවලට ඇහුම්කන් දෙන්න. |
| 3 | තැඹිලි | | |
| 4 | තැඹිලි | සුනාමි තත්ත්වයක් ඇතිවීමට ඉඩ කඩ ඇත. | වෙරළෙන් ඈත් වන්න. විමසිලිමත් වන්න. මාධ්‍යවලට සවන් දෙන්න. |
| 5 | තැඹිලි | සුනාමියක් ඇතිවිය. ශ්‍රී ලංකා වෙරළට බලපෑමක් ඇතිවිය හැක. | වෙරළෙන් ඈත් වන්න. උස් තැනකට ඉවත් වීමට සූදානම් වන්න. වටිනා ද්‍රව්‍ය ආරක්ෂිතව තබාගන්න. |
| 6 | රතු | සුනාමියක් ඇතිවිය. ශ්‍රී ලංකා වෙරළට එම සුනාමිය බලපානු ඇත. | වෙරළාසන්නයෙන් ඈත්වන්න. පෙර සූදානම් කර, නම් කර ඇති උස් තැනකට යන්න. |
| 7 | රතු | | |
| 0 | කොළ | සුනාමි අනතුරු ඇඟවීමේ නිවේදනය ඉවත් කිරීම/අවලංගු කිරීමේ නිවේදනය. අනතුරක් නැත. | |

උදාහරණයක් ලෙස ඉහත සුනාමි වගුවේ අංක 4 තැඹිලි වර්ණයෙන් “සුනාමියක් ඇතිවීමට ඉඩකඩ ඇති බවත් වෙරළාසන්නයේ සිටින ඔබ එයින් තරමක් ඈත්වී විමසිල්ලෙන් සිටින ලෙසත් දැනුම් දෙයි”.

එම අංකයම සහ වර්ණය සුළිකුණාටු සඳහා භාවිත කලහොත් සුළිකුණාටු තත්ත්වයක් ඇති බවත් නොට්ස් 40ක වේගයෙන් එනම් පැයට කි.මී. 80 පමණ වේගයෙන් සුලං හමන අතර තද සුළං සමඟ රළු මුහුදු තත්ත්වයක්ද ඇති බවත් දැනුම් දෙයි. ඔබ වෙරළින් ඈත්වී නිවෙස් තුල සිටින ලෙස ඉල්ලා සිටී. වර්ණය රතු පැහැය නම් එම අනතුරු සහිත ස්ථාන වලින් ඉවත් විය යුතු බවද එම වගු පෙන්වා දෙයි.

මීලඟට ගැටළුව වන්නේ දිස්වන වර්ණය සඳහා අනතුර සුනාමි තත්ත්වයක්ද නැතිනම් සුළි කුණාටු තත්ත්වයක්ද යන්න දැන ගැනීමය. මේ සඳහා අනතුර නිරූපනය කරන සංකේත භාවිත කෙරේ. එම සංකේත පහත රූපයේ දැක්වේ.

කිසියම් ආපදාවක් සම්බන්ධව අංකය හා වර්ණය අනුව එහි ස්වභාවය සන්නිවේදනය වන මෙම සරල ක්‍රමවේදයට අනුකූලව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අනතුරු ඇඟවීම් වල සාම්පල කිහිපයක් ද පහත දැක්වේ. විශේෂයෙන්ම ඔබ මෙම අනතුරු ඇඟවීම් මහජනතාව වෙත ගෙන යාමට අපට උදව් කරන්නේ නම්, ඔබ මෙම සාම්පල කියවා තරමක් හුරුවීම වඩාත් සුදුසුය. මෙම වර්ණ සංඥා සහ අනතුරු ඇඟවීම් සාම්පල ගැන ඔබේ අදහස් 011 2 684 746 වලට දැනුම් දෙන්නේ නම් ඉතා කෘතඥ වෙමු.

*ජාතික කාලගුණ විද්‍යා හා සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය*
*කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව*

TB....

## <u>භූ චලනය සම්බන්ධ ප්‍රවෘත්ති නිවේදනය.</u>

**කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ජාතික සුනාමි පූර්\ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
**200…,….,…… දින පැය ………. ට නිකුත් කරන ලදි**

අද (200… . ….......) පෙව/පව ….....…ට උතුරු/දකුණු සුමාත්‍රා දිවයින ආසන්නයේ රිච්ටර් පරිමානයේ ….....…ක භූ චලනයක් සිදුවී ඇත. මේ හේතුවෙන් සයුර සිසාරා සුනාමි තත්ත්වයක් ඇති නොවේ. එබැවින් ඒ සම්බන්ධව කලබලයට පත් නොවන ලෙස ජනතාවට දැනුම් දෙනු ලැබේ.

## <u>பூகம்பம் பற்றிய தகவல் அறிக்கை</u>

**வளிமண்டலவியல் திணைக்களத்தின் தேசிய சுனாமி முன்னெச்சரிப்பு மையத்தினால் 200...... ஆம் ஆண்டு ........... மாதம் ............. ஆம் திகதியில் ..............................மணிக்கு வழங்கப்பட்டது.**

இன்று (200....................) காலை / மாலை ................ மணிக்கு ...................... றிச்சர் அலகு பருமனைக்கொண்ட பூகம்பம் ஒன்று வடக்கு/தெற்கு சுமத்திரா இல் ஏற்பட்டுள்ளது. இப்பருமனுடைய பூகம்பத்தினால் எவ்வித சமுத்திர ரீதியான சுனாமியையும் உருவாக்கமுடியாதாகையால் பொதுமக்கள் அமைதியாக இருக்கும்படி ஆலோசனை வழங்கப்படுகிறது.

## <u>EARTHQUAKE INFORMATION BULLETIN</u>

(Issued by the National Tsunami Early Warning Centre, Department of Meteorology,
at ……… hours on …… ……….. 200…)

An earthquake of magnitude …… in Richter scale has occurred off north/south Sumatra Islands, at ……. AM/PM today (….. …… 200…). An earthquake of this magnitude cannot generate ocean wide tsunami and hence the general public is advised to stay calm.

Action required: **No action required; information only**

Earthquake details

| | |
|---|---|
| Location: ........................... | Coordinates: …….. N, ……….E |
| Local time: …..… AM/PM | Depth: ……. Km |
| Magnitude: …….. | Displacement: Lateral/ Vertical |

Duty Meteorologist
Department of Meteorology,
Bauddhaloka Mawatha,
Colombo- 07.

**EARTHQUAKE OF ……..… OFF SUMATRA. NO TSUNAMI EXPECTED AND FOR INFORMATION ONLY.**

**TB…..** **Signal level:-** **Colour:-**

## <u>ප්‍රභල භූ චලනය පිළිබද උපදේශාත්මක නිවේදනය</u>

**කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ජාතික සුනාමි පූර්\ව අනතුරු ඇගවීමේ මධ්‍යස්ථානය විසින්**
**200…,…,…… දින පැය ………. ට නිකුත් කරන ලදි**

අද (200.. . ..........) ශ්‍රී ලංකාවේ වේලාවෙන් පෙව/පව……… පමණ උතුරු/දකුණු සුමාත්‍රා දිවයින ආසන්නයේ රිච්ටර\ මාපාංක . . . …… ක ප්‍රභලත්වයෙන් යුත් භූමිකම්පාවක් සිදුවිය. මෙම භූමිකම්පාව ශ්‍රී ලංකාවට කි.මී. . …… ක් පමණ දුරින් කේන්ද්‍රගත වී ඇත.
ලැබී ඇති තොරතුරු අනුව මෙම භූමිකම්පාව මගින් සුනාමි ත්ත්වයක් ඇතිවූ බවට මෙතෙක් වාර\තා වී නැත. කෙසේ වෙතත් අදාල අංශ විමසිලිමත්ව සිටින බැවි ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ වල ජනතාවට දැනුම් දෙනු ලැබේ.

## <u>பாரிய பூகம்பம் பற்றிய கண்காணிப்பு அறிக்கை</u>

**வளிமண்டலவியல் திணைக்களத்தின் தேசிய சுனாமி முன்னெச்சரிப்பு மையத்தினால் 200...... ஆம் ஆண்டு ........... மாதம் ............ ஆம் திகதியில் ............................மணிக்கு வழங்கப்பட்டது.**

இன்று (200.....................) காலை / மாலை ................ மணிக்கு வடக்கு/தெற்கு சுமத்திரா தீவுக்கு அருகாமையில் ...................... றிச்சர் அலகு பருமனைக்கொண்ட பாரிய பூகம்பம் ஒன்று ஏற்பட்டுள்ளது. பூமி அதிர்வு மையத்திற்கும் இலங்கைக்கும் இடைப்பட்ட தூரம் ..................... கிமீ க்கும் அதிகமானதாகும். கிடைக்கப்பட்ட தகவல்களின் அடிப்படையில் சுனாமி நிலைமைகள் தற்போது எதுவுமில்லை. எவ்வாறிருப்பினும் சம்பந்தப்பட்ட அதிகாரம் பெற்ற நிறுவனத்தினர் இந்நிலைமையை மிகவும் உன்னிப்பாகக் கவனித்துவருகின்றனர் என்பதை கரையோரவாழ் இலங்கை மக்களுக்கு அறியத்தரப்படுகிறது.

## MAJOR EARTHQUAKE WATCH BULLETIN

(Issued by the National Tsunami Early Warning Centre, Department of Meteorology,
at ……… hours on ….. ……… 200.. )

A major earthquake of magnitude ……... in the Richter scale has occurred off north/south Sumatra Islands at …..…. AM/PM today (….. …….. 200….). The distance between the epicenter and Sri Lanka is over ……… kilometers.
According to the information available, no tsunami conditions exist at present. However, people in the coastal areas of Sri Lanka are informed that relevant authorities are closely monitoring the situation.

Action required: **Information only, be vigilant and listen to media**

Earthquake details

| | |
|---|---|
| Location: ............................ | Coordinates: …….. N, ……….E |
| Local time: ……… AM/PM | Depth: ……. Km |
| Magnitude: …….. | Displacement: Lateral/ Vertical |

Duty Meteorologist
Department of Meteorology,
Bauddhaloka Mawatha,
Colombo- 07

**MAJOR EARTHQUAKE OF ……… OFF SUMATRA.NO TSUNAMI OBSERVED. SITUATION MONITORED.**

**ST.....**

# සුනාමි තත්ත්වයක් පිළිබඳ විශේෂ නිවේදනය

කාළගුණ විද්‍යා දෙපාර\තමේන්තුවෙහි ජාතික සුනාමි පූර\ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
200...,....,...... දින පැය .......... ට නිකුත් කරන ලදි

ලඟදී විය හැකි සුනාමි තත්ත්වයක් පිළිබඳව ජනතාව අනියත බියකින් පසුවන බව දැනගන්නට ලැබී ඇත. සුනාමි පිළිබඳව දින ගණනකට කලින් දැනුම් දීමට හැකි තාක්‍ෂණයක් මේ වන විට නොමැත. එබැවින් ඉහත කටකථාවට කිසිදු විද්‍යාත්මක පදනමක් නැත.
මේ නිසා කලබල නොවී සිටින ලෙසත්, අදාල ජාතික ආයතන මඟින් නිකුත් කරන නිවේදන පිළිබඳව පමණක් කටයුතු කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

# சுனாமி நிலைமை பற்றிய விசேட அறிவித்தல்

**வளிமண்டலவியல் திணைக்களத்தின் தேசிய சுனாமி முன்னெச்சரிப்பு மையத்தினால் 200...... ஆம் ஆண்டு ........... மாதம் ............ ஆம் திகதியில் .............................மணிக்கு வழங்கப்பட்டது.**

அடுத்துவரும் சில தினங்களில் இலங்கைக்கான ஒரு சுனாமி அச்சுறுத்தல் தொடர்பான பல்வேறு விசாரணைகள் கிடைக்கப்பெற்றுள்ளன. சுனாமி நிகழ்வு பற்றி மிகவும் முன்கூட்டியே எதிர்வுகூறுவதற்குத் தற்போதைய தொழில் நுட்பம் இன்னமும் நன்கு விருத்தியடையவில்லை. இது விஞ்ஞான ரீதியற்ற ஒரு வதந்தியாகும். எனவே சம்பந்தப்பட்ட அதிகாரம்பெற்ற நிறுவனத்தினரால் வழங்கப்படும் ஊடக அறிக்கை களை அனுசரித்து அமைதியாக இருக்கும்படி பொதுமக்கள் கேட்க்கப்படுகின்றனர்.

# SPECIAL ANNOUNCEMENT ON A TSUNAMI SITUATION

(Issued by the National Tsunami Early Warning Centre, Department of Meteorology,
at ……… hours on ….. …………. 200…)

There have been various inquiries regarding a tsunami threat to Sri Lanka during the next few days. Current technology is not yet advanced enough to predict tsunami occurrence days in advance and therefore it is a scientifically baseless rumour.
General public is advised to stay calm and be guided by media reports issued only by relevant national authorities.

Action required: : **No action required**, **Information only**

Duty Meteorologist
Department of Meteorology,
Bauddhaloka Mawatha,
Colombo- 07.

**BASELESS RUMOUR AND NO THREAT OF TSUNAMI**

**TB.....** **Signal level:-** **Colour:-**

---

## සුනාමි අවදානම සම්බන්ධ නිවේදනය.

කාලගුණ විද්‍යා දෙපාර\තමේන්තුවෙහි ජාතික සුනාමි පූර\ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 200.. ,....,...... දින පැය ......... ට නිකුත් කරන ලදි

---

රිච්ටර\ මාපාංක . ......... ක ප්‍රබලත්වයක් සහිතව තදබල භූමිකම්පාවක් අද (200.. . .........) පෙ.ව./ප.ව. . ......... ට උතුරු/දකුණු සුමාත්‍රා දිවයින අසල මුහුදු ප්‍රදේශයෙන් වාර\තා වී ඇත. දැනට ලැබී ඇති වාර\තා වලට අනුව මෙම භූ චලනය ඉන්දියන් සාගරයෙහි සුනාමි තත්ත්වයක් වර\ධනය කිරීමට හේතුවිය හැක.

අදාල නිලධාරීන් තත්ත්වය නිරන්තරයෙන්ම නිරීක්ෂණය කරන බවත්, ලැබෙන වාර\තා හැකි ඉක්මනින් ජන මාධ්‍ය හරහා මහජනතාව වෙත නිකුත් කරන බවත් තවදුරටත් දන්වා සිටී.

---

## சுனாமி கண்காணிப்பு அறிக்கை

வளிமண்டலவியல் திணைக்களத்தின் தேசிய சுனாமி முன்னெச்சரிப்பு மையத்தினால் 200...... ஆம் ஆண்டு ........... மாதம் ............ ஆம் திகதியில் .........................மணிக்கு வழங்கப்பட்டது.

---

இன்று (200...................) காலை / மாலை ................ மணிக்கு சுமத்திரா தீவுககு வட்கே/தெற்கே ...................... றிச்சர் அலகு பருமனைக்கொண்ட பலத்த பூகம்பம் ஒன்று ஏற்பட்டுள்ளது. இப் பூகம்பத்தினால் இந்து சமுத்திரத்தில் சுனாமி உருவாகலாம் என ஆரம்பத் தகவல்கள் குறிகாட்டுகின்றன. சம்பந்தப்பட்ட அதிகாரத்தினர் இந்நிலைமையை மிகவும் உன்னிப்பாக அவதானித்து வருவதுடன், புதிய தகவல்கள் உடனுக்குடன் ஊடகங்களினூடாக அறிவிக்கப்படும் என்பதையும் பொதுமக்களுக்கு அறியத்தரப்படுகிறது.

---

## TSUNAMI WATCH BULLETIN

(Issued by the National Tsunami Early Warning Centre, Department of Meteorology, at ……… hours on ….. …………. 200…)

---

A severe earthquake of magnitude ……. in the Richter scale has occurred off north/south Sumatra Island at ……. AM/PM today (…. .,….. 200…). Preliminary information indicates that this earthquake has the potential to generate tsunami in the Indian Ocean. The general public is informed that the relevant authorities are closely monitoring the situation, and the new information will be publicized through media to the public, soon as available.

---

Action required: **Stay away from beach, be vigilant, listen to media.**

---

Earthquake factors

| | |
|---|---|
| Location: ............................ | Coordinates: …….. N, ……….E |
| Local time: ……… AM/PM | Depth: ……. Km |
| Magnitude: ……... | Displacement: Lateral/ Vertical |

---

Duty Meteorologist
Department of Meteorology,
Bauddhaloka Mawatha,
Colombo- 07.

---

**SEVERE EARTHQUAKE OF ……… OFF SUMATRA. SITUATION CLOSELY MONITORED. AWAIT DETAILS.**

---

**SEVERE EARTHQUAKE OF ..…… OFF SUMATRA. AWAIT DETAILS.**